# රාජත්වය හා රාජ්‍යය තුළ පුරෝහිත භූමිකාව

- ආධුනික කථිකාචාර්ය කුඩාවැවේ සෝමානන්ද හිමි

රාජත්වය මෙන්ම රාජ්‍යය තුළ ප්‍රබල භූමිකාවක් ඉටු කළ අයෙකු හැටියට පුරෝහිත තනතුර ගෙනහැර දැක්විය හැකිය. පුරෝහිත හරහා ඒ හා සම්බන්ධ චාරිත්‍ර වාරිත්‍ර ආදිය මෙන්ම ජ්‍යෝතිෂ්‍ය යොදා ගැනෙන අවස්ථාවල දී කටයුතු කරන ලදි.

ශ්‍රී ලාංකේය හා ඉන්දීය සමාජයේ බ්‍රාහ්මණයා සම්බන්ධ නොයෙකුත් කාර්යයන් අතර ඔහුට රාජ්‍ය අනුශාසකවරයා වශයෙන් ද කටයුතු කිරීමට ඉඩ ප්‍රස්තාව ලැබුණි. එනම් පෙරවි බමුණා නැතහොත් පුරෝහිත තනතුර භාරගත් පුද්ගලයා වීම හේතුකොටගෙනය.

උගත් බ්‍රාහ්මණයෝ වේදය සම්බන්ධයෙන් පාරප්‍රාප්ත බව සූත්‍ර පිටකයෙහි සඳහන් වේ. ඉතිහාස නම් වූ පුරාණ කථා හා ක්‍ෂත්‍ර විද්‍යාත් අක්‍ෂර ප්‍රභේද නම් වූ ශික්‍ෂා හා නිරුක්තීන් පිළිබඳවත් නිපුණත්වයකින් යුක්ත වූවෙකි. නිඝණ්ඩු, ශාස්ත්‍ර, කාව්‍ය ශාස්ත්‍රාදීයෙහි දක්ෂයෙක් වගේම ව්‍යාකරණය දත් ව්‍යාකරණඥයෙකි. විතණ්ඩ ශාස්ත්‍රයෙහි හා මහාපුරුෂ ලක්ෂණ ශාස්ත්‍රයෙහි ද විචක්ෂණයෙක්ය.[1] බ්‍රාහ්මණයා කෙසේ වූවෙක් දැයි පවසන සෝණදණ්ඩ බමුණා ඉතිහාසය පස්වනු කොට ඇති නිඝණ්ඩු - කෙටුභ ශාස්ත්‍ර ව්‍යාකරණ - ශික්‍ෂා - නිරුක්ති සහිත ත්‍රිවේදයෙහි[2] පරතෙරට ගිය උගතකු වීම ගෙනහැර පායි.[3] බ්‍රාහ්මණයකු වේදය අත් නොහළ යුතුය යන බ්‍රාහ්මණ ඍෂි භාෂිතයක් වේ.[4]



බුද්ධකාලයට පෙර පවා භාරතයෙහි සාංඛ්‍ය, යෝග, න්‍යාය, වෛශෙෂික ආදී දාර්ශනික අදහස් ද දියුණු වී පැවැති බවක් පෙනේ.[5] විශේෂයෙන්ම එකල බ්‍රාහ්මණයෝ ශ්‍රැති - ස්මෘති විෂයයෙහි මෙන්ම සාමයික දාර්ශනික නොයෙකුත් විෂයයන් සම්බන්ධයෙනුත් පාණ්ඩිත්‍යයක් ඉසුලුවෝ වූහ.[6] බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක පිරිස අතර බ්‍රාහ්මණ සමාජයේ උගතුන් බොහෝමයක්ම ඇතුළත් වූ අතර බුදුන් වහන්සේ ද එකී පිරිස එනම් උගත් බමුණෝ සසුනට ඇතුළත් වීම කෙරෙහි කැමැත්ත පල කළා ද විය හැක.

බුදුරදුන්ගේ ප්‍රථම ශ්‍රාවක පිරිස බවට පත්වෙන පස්වග තවුසෝ ගිහි කාලයේ සිටම උගතුන් ලෙස සමාජයේ උසස් කීර්තියට පත් වී සිටි බ්‍රාහ්මණ වංශිකයන්ය. විශාල අතවැසි පිරිසකගේ ආචාර්යවරු වශයෙන් ප්‍රසිද්ධ වී සිටි උරුවේල, ගයා සහ නදී කාශ්‍යප යන සහෝදරයන් බමුණු තාපසවරුය. බුදුරදුන්ගේ අග්‍රශ්‍රාවකයන් බවට පත්වුණු උපතිස්ස සහ කෝලිත යන දෙදෙනා ද සමකාලීනව පැවැති නොයෙකුත් සාමයික මතයන් නුවණින් විමසීමට ලක්කොට එහි නිස්සාරත්වය දැකිමට තරම් නුවණක් පැවැති බමුණු පිරිසක්ය. තෘතිය ශ්‍රාවක මහාකාශ්‍යප මහතෙරුන් ද බ්‍රාහ්මණ ජාතික මහා පඬිවරයෙකි. බුද්ධකාලීනව සිටි එබඳු ඇඳුරෝ කිහිපදෙනෙකු වශයෙන් පොක්ඛරසාති, සෝණදණ්ඩ, පොට්ඨපාද, තාරුක්ඛ (තාර්ක්ෂ්‍ය), චංකි, ජානුස්සෝනි සහ තෝදෙය්‍ය යන මොවූහු දැක්විය හැකිය. සමහර අවස්ථාවල ස්වකීය බුද්ධියෙන් ස්ථිර නිගමනයට බැස ගැනීමට නොහැකිව සාමයික කරුණු නිරවුල් කිරීම උදෙසා බුදුරදුන්ගේ පිහිට අපේක්ෂා කර ඒවා විසඳා ගැනීමට බුදුන් හමු වූ අවස්ථා ද දැකිය හැකිය. මෙය මජ්ඣිම නිකායේ **මජ්ඣිම පණ්නාසකයේ** එන සුභ මානවකයා පිළිබඳ තොරතුරු මඟින් අනාවරණය වේ.[7] ඒතුළින් ගම්‍යවන්නේ බුද්ධිමතුන් වූයේ බ්‍රාහ්මණයන් බවත් ජ්‍යෝතිෂ්‍ය ශාස්ත්‍රය වැනි දෑ ඔවුන් හරහා සමාජගත වන බවත්ය.

මුල්කාලයෙහි දී බ්‍රාහ්මණයන් ශ්‍රී ලාංකේය සමාජයෙහි බෙහෙවින්ම සම්භාවනීය පිරිසක් වූ බව පෙනෙයි. මෙරට

බෞද්ධ සංස්කෘතිය මත හැඩගැසුණු රටක් වුවද මුල් අවධියෙහි දී බ්‍රාහ්මණයන්ට විශාල බලයක් තිබුණි. මහින්දාගමනයට පෙර අවධියෙහි දී වාසය කළ බ්‍රාහ්මණයෝ භාරතයේ සිටි බමුණන් හා සමාන වූ කාර්යභාරයන් මෙන්ම වගකීම් ඇත්තෝ වූහ.

මුල් ජනාවාස පිහිට වූ අවධියේ සිට බුදුදහම ලක්දිවට හඳුන්වා දෙන තෙක් වූ ශතවර්ෂ තුනක් වූ කාලපරිච්ඡේදය පුරාම ශ්‍රී ලාංකේය සමාජයෙහි බ්‍රාහ්මණයන්ට[8] ඉතා උසස් තැනක් හිමි වී යැයි[9] පරණවිතාන මහතා පෙන්වා දෙයි. හේම එල්ලාවල මහතා ද බ්‍රාහ්මණයන් එකල ශ්‍රී ලාංකේය සමාජයේ කෙරෙහි බොහොසෙයින් බලපැවැත් වූ සම්භාවනීය පිරිසක් යැයි පවසයි.[10]

සාහිත්‍යය මූලාශ්‍ර මඟින් මොහු විවිධ අයුරින් හඳුන්වා ඇති බවක් පෙනෙයි. **සිංහල ශබ්දකෝෂයේ** 'පෙරවිකම',[11] යනුවෙන් ද 'පෙරවිකන්',[12] 'පෙරවිදෑ',[13] 'පෙරවි බමුණා'[14] යනුවෙන් **අමාවතුරේ** සහ **සද්ධර්මරත්නාවලියේ** ද 'පෙරවියා','පෙරෙවියා'[15] යනුවෙන් රුවන්මලේ ද සඳහන් වෙයි. මේ සෑම වචනයකින්ම වාගේ ගෙනහැරපානු ලබන්නේ පුරෝහිත බ්‍රාහ්මණයා රජුගේ අග්‍ර උපදේශක, ප්‍රධාන අනුශාසක, පුරෝහිත තනතුර දරන්නා යන්නයි.

ලක්දිව පමණක් නොව ඉන්දියාවේ වෛදික යුගයේ දී පවා බ්‍රාහ්මණයා රාජකීය අනුශාසකයා වූ අතර පාලන ක්ෂේත්‍රයට සම්බන්ධව විසූ 'රත්නීන්' අතර ප්‍රධාන තැනක් ලබාගෙන සිටියේය.[16] රජුගේ දෛනික කටයුතුවල දී ද පුරෝහිත තනතුර දැරූ තැනැත්තා උපදේශකයන් වශයෙන් ක්‍රියා කළ අයුරු ද ජාතක සාහිත්‍යයට අනුව පැහැදිලි වේ.[17] මෙම තනතුරට පත් වූ පුද්ගලයාට එනම් පුරෝහිත තනතුරට යුධ කටයුතු, ආගමික කටයුතු හා දේශපාලන කටයුතු පිළිබඳව ද මනා නිපුනයකු හැටියට ක්‍රියා කළ හැකි තැනැත්තෙකු විය යුතුයි.[18] එපමණක් නොව අධිකරණ කටයුතු සම්බන්ධයෙන් ද බ්‍රාහ්මණයන් දැනීමකින් යුක්තව සිටි අයුරු **කිංචණ්ඩ ජාතක** කථාව වැනි ජාතක කථා මඟින් පැහැදිලි වේ.[19]



ඓතරේය බ්‍රාහ්මණයේ යාග පූජාවක් පැවැත්වීම උදෙසා සෑම රජෙකුට ම පුරෝහිතයකු සිටිය යුතු බව කියැවේ.[20] එසේ නොවුනහොත් දෙවියෝ එම පූජාවන් පිළි නොගනිතියි පැවසූහ. **මහාසුපින ජාතකය**[21] වැනි ජාතක කථා තුළින් අයහපත් සිහින නිසා රජුට වන අයහපත් තත්ත්වයන් පුරෝහිත විසින් යාග පූජා පවත්වා දුරු කළ යුතු බව පෙනෙයි. එහෙයින් පුරෝහිත තැනැත්තා උදෑසනම රජු හමුවීම[22] කළ යුතුවේ. ඉන් අනතුරුව රජුගේ යුද්ධායුධ ද මංගල හස්තියා මෙන්ම මංගල අශ්වයා ද අයත් අශුභ පල මන්ත්‍ර මඟින් දුරු කළ යුතුය.[23] මෙමඟින් ගම්‍ය වනු ලබන්නේ රජුගේ බොහෝ කාර්යයන් පුරෝහිත බමුණාගේ උපදෙස් මත සිදු කෙරෙන බවක්ය.

පුරෝහිත බ්‍රාහ්මණයා ආගමික ගුරුවරයා මෙන්ම එදිනෙදා ජීවිතයෙහි රජුගේ උපදේශකයා බවට පත් වූ අයුරු නොයෙකුත් අවස්ථා මඟින් පෙනෙයි. ස්වකීය ගුරුවරයා ලෙස පෙරෙවි බ්‍රාහ්මණයාට උසස් තත්ත්වයක් ලබාදුන් බව **සරභංග ජාතකයෙන්** පෙනෙයි.[24] ලෞකික සහ ලෝකෝත්තර ජීවිතයෙහි ප්‍රධාන මාර්ගෝපදේශකයා ලෙස රජුට සේවය කළ බව මින් හැඟවෙයි. **සම්භව ජාතකය** සඳහන් කරන පරිදි කෞරව්‍ය නම් රජුහුගේ සුචිරථ නැමැති පුරෝහිතයා ප්‍රශ්න ව්‍යාකරණය කළ හෙයින් ධනයෙන් පිදුම් ලැබූ බව පැහැදිලිය.[25] යම්කිසි අවස්ථාවක ස්වකීය පැරණි ගුරුවරයා පුරෝහිත තනතුරට පත්කර ගත් අයුරු ද ඇතැම් අවස්ථාවල දක්නට ලැබෙයි. එසේම ඔහු පියා ලෙස සලකා ඔහුගේ අවවාද අනුව ක්‍රියා කොට තිබේ.[26] තවද සුද්ධෝදන රජ්ජුරුවන්ගේ පියාණන් සිංහහනු නම් රජ්ජුරුවන්ගේ අග්‍රපුරෝහිත වූ කාළදේවල ඇමැති තනතුරත් සුද්ධෝදන රජ්ජුරුවන් බාල කාලයේ ශිල්ප උගැන් වූ ගුරුවරයා වශයෙනුත් කටයුතු කොට තිබේ.[27]

පුරෝහිත තනතුරු සාමාන්‍යයෙන් පාරම්පරිකව යම්කිසි පවුලකට ලැබෙන්නෙකි.[28] එය **සුසීම ජාතකයේ** එන පරිදි පරම්පරා හතක්ම හසත්‍යාභිෂේකය එකම පවුලක් කිරීමෙන් පැහැදිලිය.[29] අග්ගිදත්ත නම් පෙරෙවි බමුණානන්ගේ වස්තුව

මගින් ද ඒ බව පෙනෙයි. එහි එම බමුණා මහ කෝසල රජ්ජුරුවන්ගේ පුරෝහිත තනතුර දැරුවා පමණක් නොව ඔහුගෙන් පසු පසේනදී කොසොල් රජ්ජුරුවෝ ද පියාණන්ටත් පුරෝහිත කම් කළ හෙයින් ගෞරවය ඇතිව එම තනතුරෙහි තැබීය.[30] රජු හා පුරෝහිතයා අතර ඉතා කිට්ටු සබඳතාවක් ඇති වූ අතර ශස්ත්‍ර (යුද්ධ කටයුතු) හා ශාස්ත්‍රයන්හි (ආගමික කටයුතු) මෙන්ම දේශපාලන විද්‍යාව සම්බන්ධයෙන් මනා අවබෝධයක් තිබිය යුතු යැයි අපේක්ෂිතය.[31] ඇතැම් අවස්ථාවල රජු මෙන් ක්‍රියා කිරීමට අවස්ථාව ලැබීමට තරම් පුරෝහිතයා බලවත් වූවකු විය.[32] **මහාසුසීම ජාතකයේ** මහා බෝසතාණන් සුසීම නම් පුරෝහිත බ්‍රාහ්මණව පුරෝහිත ධර්මයන් පූරණය කොට රජුට අනුශාසනා කළ අතර පසුව වොටුණු පලඳවා රාජ්‍යය ද පාවා දී තිබේ.[33] **රාමායණයේ** දැක්වෙන වශිෂ්ඨ[34] නැමැත්තා රාජ්‍යය අරාජක අවස්ථාවේ ක්‍රියා කිරීමේ අයුරුත් ලක්දිව උපතිස්ස පුරෝහිතයා රජු වශයෙන් ක්‍රියා කිරීමෙන් ද මොවුනගේ බලවත් බව මනාව පැහැදිලි වේ.[35] **කෞටිල්‍යගේ අර්ථ ශාස්ත්‍රයේ** පුරෝහිතයකුට වැටුප ලෙස පණ 4,800 ක් ලැබිය යුතු යැයි සඳහන් වේ.[36] ඇතැම් විට මෙය මාසික වැටුප විය හැකි යැයි එල්ලාවල මහතා පවසයි.[37]

ශ්‍රී ලංකාවේ පුරාතන අවදියේ සිටම බ්‍රාහ්මණයන් විසූ බවට සාහිත්‍යය හා විශේෂයෙන්ම අභිලේඛන වැනි පුරාවිද්‍යාත්මක සාක්ෂි ලැබීමෙන් ද පෙනෙයි. ලක්දිවට බුදුදහම ලැබීමට පෙර සහ පසුව ද පෙරවියන් ස්වකීය කාර්යයන් සඳහා රජවරු තබාගෙන සිටියෝය. ඒ අනුව ආදීම යුගයේ සිටම බමුණා පුරෝහිත කාර්යයෙහි යෙදී සිටියේය. **මහාවංසයේ** සඳහන් වන්නේ විජය විසින් පුරෝහිත[38] තනතුරෙහි යොදා ගත්තේ උපතිස්ස නැමැති බ්‍රාහ්මණයාය. මොහු උපතිස්ස ග්‍රාමය ඉදිකළා පමණක් නොව විජයගෙන් පසු කෙටි කාලයක් රාජ්‍යය විචාරීමේ කාර්යයෙහි ද නියැළී ඇත.[39] මේ තුළින් පැහැදිලි වන්නේ මේ අවදියේ බ්‍රාහ්මණ පුරෝහිතයකුට සමාජයේ ඉහල තත්ත්වයක් පැවැති බවත් ඔහු සමාජයේ පමණක් නොව රාජ්‍ය පාලන කාර්යයෙහි නියැලීමට පවා වඩා වැදගත් කමක් ඉසුලු බවත්ය.



මීළඟ පාලකයා හැටියට එන පණ්ඩුවාසුදේව රජුගේ රාජ්‍ය සභාවේ මන්ත්‍රයෙහි පාරප්‍රාප්ත බමුණෝ සිටි බව සඳහන් වෙති.[40] එම පිරිසෙහි එතුමාගේ පුරෝහිත බමුණා සිටියා වියහැක. එසේ වුවහොත් රාජ්‍යාභිෂේක කටයුතු ආදියත් පුරෝහිත තනතුරෙහි කාර්යභාරයත් ඔහුගෙන් ඉටුවුණා විය හැක. පණ්ඩුකාභයගේ රාජ්‍ය කාලයේ විශාල කාර්යභාරයක් පැවැරී තිබුණේ පණ්ඩුල බමුණාටය. ඔහුගේ පුත්‍ර චන්ද්‍ර නමැත්තා පණ්ඩුකාභයගේ රාජ සභාවේ පුරෝහිත තනතුරට පත් කළේය.

ක්‍රි. පූ. තුන්වැනි සියවසෙන් පසු බ්‍රාහ්මණයන් ලබා තිබූ තත්ත්වයට ප්‍රබල බලපෑමක් මහින්දාගමනයත් සමඟ ඇතිවෙන බව පැහැදිලි ය. මීට පෙර රජුගේ අනුශාසකයා, උපදේශකත්වය වැනි නොයෙකුත් කාර්යයන් කළ බ්‍රාහ්මණ පුරෝහිතයාගේ තත්ත්වය පසුබෑමකට ලක් වූ බව පැහැදිලිව පෙනෙන කාරණයකි.[41] ආගමික පාර්ශ්වය සඳහා ජනතාව ඒකරාශි කිරීමේ දී සහ සංවිධානය කිරීමේ දී ප්‍රබල ස්ථානයක් හිමි වේ.[42] පුරාතන සමාජ ඇසුරින් ඒ. එම්. හෝකාර්ට් කළ පරියේෂණ තුළින් මුල් ගෝත්‍රික සමාජයන්හි ද ගෝත්‍රික නායකත්වය බිහිවීමටත් එය හැඩගැස්වීමටත් ආගම විශාල අනුබලයක් කරන බව පෙන්වා දෙයි.[43] ලක්ෂ්මන් එස්. පෙරේරා ඉන්දීය සමාජය හැඩගැස්වීමට බ්‍රාහ්මණයන්ගේ දායකත්වය කෙබඳු ද එලෙසම බෞද්ධ භික්ෂුවගෙන් පුරාතන ශ්‍රී ලාංකේය සමාජය සංවිධානය කිරීම කෙරෙහි නොදෙවෙනි කාර්යයක් කළ බව පවසයි.[44] මකියාවලි ද ආගම හා සදාචාරය පාලන කටයුතුවලට බලපාන බව පෙන්වා දෙයි.[45]

ඒ අනුව පෙනීයන්නේ භික්ෂුව ඉතාම සමීපව ආශ්‍රය කිරීමට රාජ්‍ය පාලකයා අපේක්ෂා කළ බවත් නිරතුරුවම උපදේශකත්වය, අනුශාසකත්වය භික්ෂුවගෙන් ලබාගත් බවය. රොබට් ලින්ගා[46] බ්‍රාහ්මණික පුරෝහිතගෙන් ඉටු වුණු සේවයට සමාන වූ සේවයක් භික්ෂූන්ගෙන් රජු වෙත ඉටු වුණු බව පවසයි.[47] භික්ෂුව මහින්දාගමනයෙන් අනතුරුව උපදේශකවරයා ලෙසත්, ආචාර්යවරයා, අනුශාසකවරයා මෙන්ම ගුරුවරයා යනාදී විවිධ තත්ත්ව යටතේ කටයුතු කරන බවක් පෙනෙයි. මුල් අවදියේ

සිටම භික්ෂූන් වහන්සේ රාජ්‍යය සහ පාලකයා සමඟ සමීප සබඳතාවක් පැවැත් වූහ. රණවීර ගුණවර්ධන මහතා සංඝ සමාජය මුල්කාලයේ පටන්ම ලෞකික අධිකාරීන් සමඟ සමීපව සහයෝගයෙන් යුතුව කටයුතු කිරීමෙහිලා තුඩුදුන් ආකල්පයන් දක්නට ලැබුණු බව පවසයි.[48]

සාහිත්‍යය මූලාශ්‍රවලට අනුව පණ්ඩුකාභය දේවානම්පිය තිස්ස ආදී මුල්කාලයට අයත් පාලකයනට[49] පුරෝහිතයන් සිටි බව පැහැදිලිය. නමුත් මින්පසුව එළඹෙන කාලපරිච්ඡේදය තුළ පාලකයාට පුරෝහිතගේ සහය ලැබුණු බවට සාක්ෂි නොමැති[50] අතර පුරෝහිත තනතුරු දරන ලද භික්ෂූන් පිළිබඳවත් මූලාශ්‍රවල තොරතුරු සඳහන් නොවේ යැයි ඇතැම්හුගේ අදහස වෙති.[51] ධීරානන්ද හිමියන් භික්ෂූන් පාලකයන් සමඟ සමීපව වාසය කිරීමත් නොයෙකුත් උපදෙස් ලබාදීමට කටයුතු කිරීමත් යන්න මත පුරෝහිතගෙන් ඉටුවුණු කාර්යයන් භික්ෂුවගෙන් ඉටුවුණි යැයි සිතීමට අවකාශ ඇති බව පවසයි.[52]

එනමුඳු මෙහි දී අවධානයට යොමුවිය යුතු කරුණක් වන්නේ බ්‍රාහ්මණ පුරෝහිතයාගේ කාර්යභාරය මුළුමනින්ම රාජ්‍ය කටයුතු වලින් හා රාජත්වය සඳහා වූ චාරිත්‍ර වාරිත්‍ර වලින් බැහැර වුවාද යන්නයි. මක්නිසාදයත් බුදුසමය ලක්දිවට ලැබුණු පසුව ද යම් යම් සාධක මේ පිළිබඳව අනුමිතීන් ගොඩනඟා ලීම සඳහා පවතින හෙයින්ය. තිස්ස රජුගේ කාලයේ නෛමිත්තකයන්[53] සහ ඔහු විසින් ඉන්දියාව වෙත යවන ලද දූත පිරිසෙහි සිටි බ්‍රාහ්මණයාට අශෝක අධිරාජයා විසින් පුරෝහිත තනතුර ප්‍රදානය කරන ලද බව පැහැදිලිය.[54] කාකවණ්ණ තිස්ස රජුගේ කාලයේ පවුලේ පූජකයන් වශයෙන් බ්‍රාහ්මණයෝ වූහ.[55] මොවුන් අතර රජුගේ පුරෝහිතයකු සිටිය හැකි අතර බ්‍රාහ්මණයන් පූජකයන් වශයෙන් ද කටයුතු කරන්නට ඇත.

එසේම දුටුගැමුණුගේ මිත්‍රයෙක් හැටියට ද්වාරමණ්ඩල නම් ගමෙහි වාසය කළ කුණ්ඩල නම් බමුණෙක්[56] සිටි අතර පුරෝහිතයකු පිළිබඳව තොරතුරක් දක්නට නොමැත. විවිධ පුරුෂයන් රාජ්‍යයත්වයට පත්කොට සැමියන් වශයෙන් පත්කර



ගත් අනුලා පුරෝහිත බමුණකු ලවා මාස හයක් රජය කරවිය.[57] අනුරාධපුර අවදිය අවසන් වී එළඹෙන පොළොන්නරු කාලපරිච්ඡේදය තුළ දී බ්‍රාහ්මණ බලය මෙන්ම හින්දු ආගමික බලපෑම වර්ධනය වන අයුරු පැහැදිලිය. මහාපරාක්‍රමබාහුගේ දෙමව්පියන් වන මානාභරණ සහ රත්නාවලී දෙදෙනා කුමරා පිළිසිඳ ගැනීම සම්බන්ධව දකින ලද සිහිනය පුරෝහිත බ්‍රාහ්මණයාගෙන් සහ නිමිත්ත පාඨකයන්ගෙන් විචාළ බව වංසකථාවේ සඳහන් වේ.[58] මානාභරණ භික්ෂූන් ලවා පිරිත් කීම පමණක් නොව 'වේද වේදාංග දන්නා බමුණන් ලවා ශුභ යැයි සම්මත වූ යාගා දී විදහන්' ද පවත්වන ලදි.[59] එමෙන්ම මහණ බමුණන් සඳහා දන් දුන්[60] අතරම වේදයෙහි එන පරිදි ජාතකර්මාදී විධි පැවැත්වුණු බවත් ඉන් අනතුරුව පෙරෙවි ආදී බ්‍රාහ්මණයන් ද ලක්ෂණ පාඨකයන් ද ගෙන්වා කුමාරයාගේ ලක්ෂණ විචාරණ[61] ලද බවක් ද මූලාශ්‍රවල දක්නට ලැබේ. තවද පැරකුම් කුමරුට කෞටිල්‍ය ආදී නීති ශාස්ත්‍ර ප්‍රගුණ කිරීමත්[62] උපනයන මංගල්‍යයක් පැවැත්වීමටත් වේද කටයුතු සම්බන්ධයෙන් දක්ෂ බමුණන් යොදවා තිබේ.[63]

දඹදෙණි අවදියෙහි තෙවැනි විජයබාහු රජු ස්වකීය පුත්‍රයන් වූ පරාක්‍රමබාහු කුමරු සහ භුවනෙකබාහු කුමරා ලක්ෂණවේදීන් ලවා පරීක්ෂා කිරීමත්[64] දෙවැනි පරාක්‍රමබාහු රජු මනුනීතියෙහි දක්ෂයකු වශයෙන් සඳහන් වීමෙනුත් හැඟෙන්නේ පුරෝහිත බමුණන් මේ හා සම්බන්ධ වූ බවයි.[65] මේ ආකාරයෙන් මහින්දාගමනයෙන් අනතුරුව විවිධ අවස්ථාවල දී බමුණු පුරෝහිතයන් ගැන සඳහන් වෙන අතර රාජ්‍යය අභිෂේකය පැවැත්වීමේ දී පුරෝහිතයාට ද වැදගත් තැනක් හිමිවේ.

එහෙයින් ලක්දිව රාජත්වය හා රාජ්‍යය, රාජ්‍යාභිෂේකය සම්බන්ධව අවධානය යොමු කිරීමේ දී පුරෝහිතයාට විශේෂ තැනක් හිමි වුණු බව කරුණු අනාවරණය කරගත හැකිය.

## ආන්තික සටහන්

1. රද්දැල්ලේ පඤ්ඤාලෝක හිමි, බුදුරජාණන් වහන්සේ හා බ්‍රාහ්මණ සමාජය, කොළඹ: දයාවංශ ජයකොඩි සහ සමාගම, 2004, පිටුව 18.
2. ඍග්, යජුර්, සාම යන්න ත්‍රිවේදයයි. පසුකාලයෙහි දී හතරවැනි වේදය ලෙස සැලකෙන අථර්ව වේදය ද ඇතුළත් විය. මෙම වෛදික සාහිත්‍යයෙහි කාලනිර්ණය පිළිබඳව විද්වතුන් විසින් විවිධ අදහස් පලකරයි. ඒ අනුව මැක්ස්මුලර් පඬිවරයා වේද සාහිත්‍යයෙහි ප්‍රභවය හා දියුණුව ක්‍රි. පූ. 1200 - 1000 අතර කාලයකැයි ද තිලක් හා යකොබි තාරකා ශාස්ත්‍රය අනුව ගණන් බලමින් වෛදික සූක්තයන් ක්‍රි. පූ. 4500 පමණ කාලයෙහි දී රචනා වූ බවත් රාධක්‍රිෂ්ණන් මහතාගේ පිළිගැනීම වන්නේ මේවා ක්‍රි. පූ. 15 වැනි ශතවර්ෂයේ පමණ සංගෘහිත බවයි. නමුත් ඊරාණියන්වරුන්ගේ පැරණිතම ආගමික කෘතියක් වන අවෙස්තාවත් ඍග්වේදයත් අතර ඇති සබඳතාව ගෙනහැර පාමින් වේද සූක්ත රචනයෙහි ආරම්භය ක්‍රිඃ පූඃ 2500 - 2000 අතර යැයි පවසයි.
3. දීඝනිකාය, සෝණ දණ්ඩ, පිටුව 222.
4. ''වේද සන්න්‍යසනාව් ශුද්‍රාස් තස්මාද් වේදං නසන්න්‍ය සේක්'', බෘහදාරණ්‍යක උපනිෂද්, අධ්‍යාය 3, බ්‍රාහ්මණ ශඞ්කර භාෂ්‍ය 5, පිටුව 713.
5. එම, පිටුව 19.
6. එම.
7. මජ්ඣිම නිකාය, සුභ සූත්‍රය, මජ්ඣිම පණ්ණාසක, පිටුව 712.
8. මහවංසයේ විජය සමඟ ලක්දිවට ආ බ්‍රාහ්මණයෙක් වූ උපතිස්ස විසින් උපතිස්ස නම් ග්‍රාමය ඉදිකළ අතර එය සුළු කලක් මේ රට අගනුවර වූ බවත් සඳහන් වෙයි. ඌපුම, පරි. 7, ගාථාව 44; මොහු විජයගේ අභාවයෙන් පසු පණ්ඩුවාසුදේව කුමරු පැමිණෙන තෙක් මෙරට පාලකයා හැටියට ද කටයුතු කළේය. එම, පරි. 8. ගාථාව 4; මේ තුළින් ගම්‍යවන්නේ එනම් ලක්දිව රාජ්‍යය විචාරීමේ කර්තව්‍යයෙහි පවා උපතිස්ස බ්‍රාහ්මණයා යෙදීමෙන් (එම, පරි. 7, ගාථාව 4ග) ඔහු සමාජයේ මෙන්ම රාජ්‍යය පාලන කාර්යයෙහි උසස් තත්ත්වයක් හිමිකර ගත් බවය. පණ්ඩුවාසුදේව රජුගේ රාජසභාවේ මන්ත්‍රයෙහි පාරප්‍රාප්ත බමුණෝ වූහ. එම, පරි. 9, ගාථාව 2; පාලි වංසකථා තුළින් පිළිබිඹු වන්නේ ලක්දිව බමුණන්ගේ තත්ත්වය ඉන්දියාවේ මෙන්ම පැවැතුණු බවය. එච්. එල්ලාවල, පුරාතන ලංකාවේ සමාජ ඉතිහාසය, කොළඹ: ලංකාණ්ඩුවේ මුද්‍රණාලය, 1968, පිටුව 13; මහාවංසයේ උපතිස්සට පසුව ලක්දිව රාජ සභාවේ අනුශාසකත්වය උසුලන ලද වේදය සම්බන්ධයෙන් මනා අවබෝධයක් තිබූ බමුණු පිරිසක් වූ බව සඳහන් වේ. ඌපුම, පරි. 9, ගාථාව 2; ඒ අතර පණ්ඩුල නම් බමුණා හට විශේෂ තැනක් හිමිවේ. පණ්ඩුලගේ උපදෙස් අනුව පණ්ඩුකාභය ක්‍රියා කළ අතර එම බමුණාගේ



පුත්‍රයා වූ චන්ද්‍ර නැමැත්තා ද එකී රාජ සභාවේ සිටියේය. එම, පරි. 10, ගාථා 19-26; බොහෝමයක් බමුණෝ පුරෝහිතයන් වශයෙන් කටයුතු කර ඇත. පණ්ඩුකාභය, ජෝතිය, ගිරි, කුම්භාණ්ඩ යන නිඝන්ඨයන් සඳහාත් මිසදිටු කුලයන් සඳහාත් පරිබ්‍රාජකයන්, ආජීවකයන් හා බ්‍රාහ්මණයන් සඳහා ද අසපු මෙන්ම වැඳුම් පිදුම් කරන තැන් පිහිටුවීමෙන් පෙනීයන්නේ ද එකල බමුණෝ සිටි බවය. S. Paranavitana "Pre - Buddhist Religions Beliefs in Cyelon," *JCRAS,* XXXI, 1929, pp 309-314.

9. ''බුදුසසුන පිහිටුවීමට පෙර ලංකාවේ පැවැති ආගමික විශ්වාස''යන මාතෘකාව යටතේ පරණවිතාන මහතා රාජකීය ආසියාතික සංගමයේ සඟරාවට සැපයූ ලිපියේ දේවානම්පිය තිස්ස රාජ්‍ය සමය තෙක් වංස කථාවල එන තොරතුරු මත බ්‍රාහ්මණයන් පිළිබඳ කරුණු ගෙනහැර පාන අතර එහි දී එකල බ්‍රාහ්මණයන් සමාජයේ සම්මානනීය තත්ත්වයක් ඉසිලූ බවත් ඇතමෙක් බුද්ධ ධර්මය ප්‍රචාරය කිරිමෙහිලා සහයෝගය දැක් වූ බවත් සඳහන් කරයි. රාජකීය ආසියාතික සංගමයේ සඟරාව (ල.ශා.) 31 කාණ්ඩය, අංක. 82, පිටු 302, 321-323.
10. එල්ලාවල, එම, 1968, පිටුව 12.
11. රජ කෙනෙකුගේ අග්‍ර උපදේශක පදවියත පුරෝහිත තනතුරත ප්‍රධාන අනුශාසක පදවිය.
12. පෙරෙව්කම, අමාව, (රිචඩ් ද සිල්වා මහානාම), 1922, පිටුව 179.
13. රජ කෙනෙකුට සිටින පුරෝහිත බමුණා, පුරෝහිත බ්‍රහ්මණයා, රජුගේ ප්‍රධාන උපදේශකයා.
14. පුරෝහිත බ්‍රාහ්මණයා, අමාව, පි. 89; සර, (ඩී. බී. ජයතිලක) 1928, පිටුව 705.

15 පැරණි රජවරුන්ගේ ප්‍රධාන උපදේශකයාත බමුණන් අතර අග්‍රස්ථානය ලද බමුණා, රුවන්මල් නිඝණ්ටුව හෙවත් නාමරතන මාලාව, (රුවන්පි) සංස්. ඩී.පී. ද අල්විස් විජයසේකර, කොළඹ: විද්‍යාසාගර යන්ත්‍රාලය. 1914, පිටුව 328.

16. R. Fick, The Social Organization in North Eastern India in Buddha's Time, tr. Maitra, Calcutta: University of Culcutta, 1920, pp 166-170.
17. ජාතක, කාණ්ඩ ඪල පිටුව 17.
18. A. S. Altekar, State and Government in Ancient India, Benares: Motilal Banasidass, 1949, p 121.
19. ජාතක, කාණ්ඩ ඪල පිටුව 175.
20. " න වෛ අපුරොහිතසස දෙවා බලි මශ්නුවන්තිග" *A.Br.* VII, 24.
21. එල්ලාවල, එම, 1968, පිටුව 12.

22. එම.
23. එම.
24. එම.
25. පූජාවලිය, (පූජා) සංස්. කිරිඇල්ලේ ඤාණවිමල හිමි, කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 2008, පිටුව 84.
26. එල්ලාවල, එම, 1968, පිටුව 13.ත පූජා, පිටු 83-84.
27. පූජා, පිටුව 137.
28. J, IV, p 200.
29. J, II, p 47.
30. සද්ධර්මරත්නාවලිය, (සර) සංස්. කිරිඇල්ලේ ඤාණවිමල හිමි, කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 2007, පිටුව 836.
31. Alterkar, op.cit, p 121.
32. Ibid.
33. පුරෝහිතයන් ගෙන්වා "ආචාරිනි ! මා කෙරෙහි ප්‍රේම ඇතියා නම් අනෙක් බසක් නොකිව" යි බෝසතුන් නොකමැති කරවා ම වොටුනු පලඳවා රාජ්‍යය පාවාදී මෑණියන් ද අගමෙහෙසින් කොට තුමු යුවරජ වූහ. පූජා, පිටුව 308.
34. එල්ලාවල, එම, 1968, පිටුව 13.
35. ඌනපූරණ සහිතො මහාවංසො, (ඌපූම) සංස්. පොල්වත්තේ බුද්ධදත්ත හිමි, කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 1959, පරි. ගාථාව 44.
36. එල්ලාවල, එම, 1968, පිටුව 13.
37. එම.
38. ඌපූම, පරි.7, ගාථාව 44.
39. එම, පරි. 8, ගාථාව 4.
40. එම, පරි. 9, ගාථාව 2.
41. ලක්දිව දේශපාලන, ආර්ථික, සමාජීය හා සංස්කෘතික පාර්ශ්වයන් හැඩගැස්වීමෙහි ලා භික්ෂු සංස්ථාවෙන් විශාල කාර්යභාරයක් ඉටු කොට තිබේ. දේවාලේගම මේධානන්ද හිමි, බෞද්ධ භික්ෂු සමාජය, වරකාපොළ: ආරිය ප්‍රකාශකයෝ, 1990, පිටුව 14.
42. හගුරන්කෙත ධීරානන්ද හිමි, රාජත්වය, රාජ්‍යය සහ ආගම, වරකාපොළ: ආරිය ප්‍රකාශකයෝ, 2004, පිටුව 364.
43. A. M. Hocart, Kings and Councillors: An Essay in the Comparative Anatomy of Human Society, ed. Rodney Needham, Chicargo: Chicago University Press, 1936, p 37.



44. ලක්ෂ්මන් එස්. පෙරේරා, "ඉතිහාසයෙන් පෙනෙන භික්ෂුව," ශ්‍රී ලංකා විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ ඉතිහාසය සංගමයේ සාකච්ඡා සම්මේලන සටහන්, කැළණිය: විද්‍යාලංකාර මුද්‍රණාලය, 1966, පිටුව 15.
45. Niccolo Machiaveli, The Prince, tr. James B. Atkinson, Indianapolis: Bobbs Merril Company, 1976, p 71.
46. Robet Lingat, Rouautes Bouddhiques Asoka et la function Royal a Ceylon, paris: Editions de I ecoledes Hautes en Sciences Sociales, 1989, p 175, යන්නෙහි ඇති බව ධීරානන්ද හිමි ගෙනහැර පායි. ධීරානන්ද හිමි, එම, 2004, පිටුව 461.
47. මහින්ද තෙරුන් දේවානම්පිය තිස්ස රජුගේ ගුරුවරයා වශයෙන් කටයුතු කළ බව මුලාශ්‍ර මඟින් තහවුරු වේ. සමන්තපාසාදිකා, (සමන්ත) සංස්. යු. එස්. එස්. ධර්මකීර්ති, කොළඹ: ග්‍රන්ථාලෝක මුද්‍රණාලය, 1900, පිටුව 40.
48. රණවීර ගුණවර්ධන, සිවුර හා නඟුල, කොළඹ: සමාජ විද්‍යාඥයින්ගේ සංගමය, 1993, පිටුව 173.
49. ඌපූම, පරි. 10, ගාථාව 79, පරි. 11, පිටුව 63; Vamsatthappakasini, Vol. I, ed. G. P.malalasekara, London, P.T.S. 1935, p. 305.
50. ධීරානන්ද හිමි, එම, 2004, පිටුව 472.
51. එම.
52. එම.
53. ඌපූම, පරි, 22, ගාථා 46-47.
54. එම, පරි, 11. ගාථා 20-26.
55. එම, පරි, 22, ගාථා 46, 47.
56. එම, පරි. 23, ගාථා 24-31.
57. "පුරෝහිත බමුණා ලවා සමසක් රජය කැරවුව", පූජා, පිටුව 774.
58. චූල, පරි, 62. ගාථාව 28.
59. එම, පරි, 62. ගාථා 31-33.
60. එම, පරි, 62. ගාථාව 4.
61. එම, පරි, 62. ගාථාව 45-46.
62. එම, පරි, 64. ගාථාව 3.
63. එම,
64. එම, පරි, 81. ගාථාව 68-70.
65. එම, පරි, ගාථාව 841.